FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2023 ජුනි

3 වන වෙළුම - කලාප අංක 06


උදුල් ඇතුළු 22ක් වසර 13කට පසු නිදහස්!


බෘෘනෝ දිවාකරට ඇප!



උතුරේ මාධ්‍යවේදීන්ගෙන් පොලිසිය ප්‍රශ්න කරයි

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/සංරචකයන්ට අදාළ සිදුවීම් 20ක් 2023 ජුනි මාසයේදී නිරීක්ෂණය විය. ආරක්ෂාව හා සුරක්ෂිතබව යන සංරචකයට අයත් සිදුවීම් 04ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 13ක්, වෘත්තියවේදීත්වයට අදාළ එක් සිදුවීමක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යන සංරචකයට අදාළ සිදුවීම් 02 ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

01. ප්‍රහසන ශිල්පීන් දෙදෙනෙකුට එල්ල වූ තර්ජන පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.
02. ප්‍රහසන ශිල්පිනී නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගැනීමට එරෙහිව පැවැත්වූ ප්‍රවෘත්ති සාකච්ඡාවක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කිරීමට අධිකරණය නියෝග කිරීම.
03. ගෝල්ෆේස් අරගලකරුවන්ට පහරදීම සම්බන්ධ නඩුව, කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ කැඳවීම.
04. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ විරෝධතා පෙළපාලියකට පොලිසිය කඳුළුගෑස් ජල සහ බැටන් ප්‍රහාර එල්ල කිරීම.
05. යෝජිත 'විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභා පනතෙහි' දළ කෙටුම්පතක් විද්‍යුත් විකාශකයින්ගේ සංගමයේ ප්‍රතිචාර සඳහා යොමු කිරීම.
06. යෝජිත විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභා පනත මගින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය උල්ලංඝනය නොකරන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කිරීම.
07. රූපවාහිනී නාලිකා දෙකකට හා වෙබ් අඩවි දෙකකට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.
08. මාධ්‍ය නියාමනය, රාජ්‍ය මර්දනය, කලාවේ හා ප්‍රකාශනයේ නිදහස මැයෙන් සංවාදයක් පැවැත්වීම.

09. යාපනයේ ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකු පොලිසියට කැඳවා ප්‍රශ්න කිරීම.

10. අරගලයේ ක්‍රියාකාරිකයින් පිරිසකට එරෙහි නඩුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ කැඳවීම.

11. උද්ඝෝෂණයකදී රජයේ දේපළවලට අනර්ථයක් සිදු කළ බවට චෝදනා ලැබ සිටි හිටපු විශ්වවිද්‍යාල සිසුන් 22 දෙනෙකු අධිකරණයෙන් නිදොස් කොට නිදහස් කිරීම.

12. සමාජ මාධ්‍ය ඔස්සේ අදහස් පළ කිරීම හේතුවෙන් පොලිස් සැරයන්වරයකුගේ වැඩ තහනම් කිරීම.

13. ගෝඨාගෝගම විරෝධතාවට පහරදීමේ සිද්ධියේ සැකකරුවකු ලෙස නි. පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් නම් කරන ලෙස නීතිපතිවරයා නිකුත් කර තිබූ ලිපියක්, අභියාචනාධිකරණය නිශ්ප්‍රභ කිරීම.

14. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනයක් හේතුවෙන් තමන්ට සිදු වන අගතිය සම්බන්ධයෙන් මාධ්‍යවේදී දර්ශන හඳුන්ගොඩ අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීම.

15. නතාෂා එදිරිසූරිය තවදුරටත් බන්ධනාගාරගත කිරීමට හා බෲනෝ දිවාකර ඇප මත මුදාහැරීමට අධිකරණය නියෝග කිරීම.

16. ප්‍රහසන ශිල්පිනී නතාෂා අත්අඩංගුවට ගැනීම සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ යෝජිත පනත, ජිනීවා මානව හිමිකම් සැසිවාරයේදී විවේචනයට ලක් වීම.

17. ආගමික සංහිඳියාවට හානි වන ආකාරයේ ප්‍රකාශ සිදු කිරීමේ චෝදනාව මත අත්අඩංගුවට ගත් රාජාංගනේ සද්ධාරතන හිමි යළි රක්ෂිත බන්ධනාගාරගත කිරීම.

18. සමාජ මාධ්‍ය ක්‍රියාකාරික ප්‍රියත් නිකේෂල, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගැනීම.

19. ප්‍රවෘත්ති සාකච්ඡාවක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට ලබා දුන් නියෝගය බල රහිත කරන්නැයි ප්‍රතිශෝධන පෙත්සමක් ඉදිරිපත් කිරීම.

20. අධිකරණයට අපහාස කිරීම පිළිබඳ නීති කෙටුම්පතක් රජය විසින් ප්‍රකාශයට පත් කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2023 ජුනි**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 04 |
| නීතිමය කොන්දේසි | 13 |
| වෘත්තියවේදීත්වය | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 02 |
| **එකතුව** | **20** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා රැසක් ජුනි මාසයේදී නිරීක්ෂණය විය. එයින් වැඩි ප්‍රමාණයක් නීතිමය ක්‍රියාමාර්ග හා සම්බන්ධ බැවින් එම සංරචකය යටතේ දක්වා ඇත.**

**2 වගුව: 2023 ජුනි: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 04**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| පහරදීම් | 01 |
| මානසික හා වෙනත් බලපෑම් | 03 |
| **එකතුව** | **04** |

01. ප්‍රහසන ශිල්පීන් දෙදෙනෙකුට එල්ල වූ තර්ජන පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.

බුදුදහමට අපහාස කිරීමේ චෝදනාව යටතේ අත්අඩංගුවට පත් නතාෂා එදිරිසූරියගේ ප්‍රහසන ප්‍රසංගයට සහභාගී වීම හා එහිදී සිනාසීම හේතුවෙන් 'ලකයි- සිකයි' නමින්

ප්‍රකට ප්‍රහසන ශිල්පීන් වන ලක්මාල් වීරසූරිය හා සහන් අරෝෂ ගේ පවුලේ සාමාජිකයින් වෙත සමාජ ජාල ඔස්සේ තර්ජන එල්ල වී ඇතැයි එම පැමිණිල්ලෙහි සඳහන් වේ. ලක්මාල් විරසූරයගේ බිරිඳ, නීතිඥවරයකු සමග  අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් එම පැමිණිල්ල ඉදිරිපත් කර තිබේ.

මූලාශ්‍රය: [theleader.lk](theleader.lk)

02. **අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ විරෝධතා පෙළපාලියකට පොලිසිය කඳුළුගෑස් ජල සහ බැටන් ප්‍රහාර එල්ල කිරීම.**

මෙම විරෝධතා පෙළපාලිය ජුනි 07 වැනිදා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අසලින් ආරම්භ වූ අතර විජේරාම මංසන්ධියේදී පොලිසිය මාර්ග බාධක යොදා පෙළපාලිය නතර කිරීමෙන් අනතුරුව කඳුළුගෑස් ජල හා බැටන් ප්‍රහාර එලල කෙරිණි. මෙම විරෝධතාවට එරෙහිව පොලිසිය කොටුව හා මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණ මගින් තහනම් නියෝග දෙකක් ලබාගෙන තිබිණි.

මූලාශ්‍රය: [www.youtube.com](www.youtube.com)

03. **යාපනයේ ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකු පොලිසියට කැඳවා ප්‍රශ්න කිරීම.**

යාපනයේ, නිදහස් මාධ්‍යවේදී තම්බිදුරෙයි ප්‍රදීපන් හා කිලිනොච්චියේ, නිදහස් මාධ්‍යවේදී ටී. පරමසිවන් ජුනි 21 වැනිදා කිලිනොච්චි නි. පොලිස්පති කාර්යාලයට කැඳවා ඔවුන් සිදු කළ වාර්තාකරණයක් සම්බන්ධයෙන් මෙලෙස ප්‍රශ්න කර තිබේ. ජුනි 2 වැනිදා මරුදන්කර්නි ක්‍රීඩා පිටියකදී පා.ම. ගජේන්ද්‍ර කුමාර පොන්නම්බලම්ට ගිනි අවියක් එල්ල කර පහරදීමට උත්සාහ කිරීමේ සිදුවීම සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කළ ආකාරය සහ එම තොරතුරු ලබා දුන්නේ කවුද යන්න මෙහිදී ප්‍රශ්න කළ බවත්, තොරතුරු මූලාශ්‍ර හෙළි කරීම තමන් ප්‍රතික්ෂේප කළ බවත් එම මාධ්‍යවේදීහු ප්‍රකාශ කරති.

මූලාශ්‍රය: [lankafiles.medium.com](lankafiles.medium.com)

04. **සමාජ මාධ්‍ය ඔස්සේ අදහස් පළ කිරීම හේතුවෙන් පොලිස් සැරයන්වරයකුගේ වැඩ තහනම් කිරීම.**

කොළඹ, කුරුඳුවත්ත පොලිසියට අනුයුක්තව සේවය කරමින් සිටි පොලිස් සැරයන් විමල් ජයසේකර (අංක 10412) විසින් යූටියුබ් ඔස්සේ වීඩියෝ 03ක් මුදාහරිමින් පොලිස් දෙපාර්තමේන්තුවේ විෂමාචාර සම්බන්ධයෙන් අදහස් පළ කර තිබිණි. මේ හේතුවෙන් ජුනි 22 වැනිදා සිට ඔහු වැඩ තහනමට ලක් කර තිබේ.

අදාළ වැඩ තහනම් කිරීමේ නියෝගයේ සඳහන් වන්නේ, එම නිලධාරියා 'ශ්‍රී ලංකා පොලිස් නියෝග ඒ 7 බී පරිශිෂ්ඨයේ විනය සංග්‍රහය යටතට ගැනෙන වැරදි හෝ විෂමාචාරයන් එකක් හෝ කිහිපයක්' සිදු කර ඇති බවයි.

මූලාශ්‍රය: [thetime.lk](thetime.lk)

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 13ක් ජුනි මාසය තුළ නිරීක්ෂණය විය. භාෂණයේ නිදහසට එරෙහි අධිකරණ ක්‍රියාමාර්ග, පෙර සිදුවීම්වල වර්ධනයන් මෙන්ම නීති ප්‍රතිසංස්කරණ යෝජනා ඊට ඇතුළත් වෙයි.**

**3 වගුව: 2023 ජුනි: නීතිමය කොන්දේසි - සිදුවීම් 13**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 10 |
| නීති ප්‍රතිසංස්කරණ | 03 |
| **එකතුව** | **13** |

01. **ප්‍රහසන කලා ශිල්පිනී නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගැනීමට එරෙහිව පැවැත්වූ ප්‍රවෘත්ති සාකච්ඡාවක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කිරීමට අධිකරණය නියෝග කිරීම.**

බුදුදහමට අපහාස වන ආකාරයේ ප්‍රකාශයක් කරන ලදැයි අත්අඩංගුවට ගෙන සිටින නතාෂා එදිරිසූරිය සම්බන්ධ නඩුව ජුනි 07 වැනිදා කොටුව මහේස්ත්‍රාත්වරයා හමුවේ කැඳවූ අවස්ථාවේ, පැමිණිල්ලේ නීතිඥවරුන් විසින් ඉදිරිපත් කළ කරුණු පදනම් කර ගනිමින්, අදාළ පුවත්පත් සාකච්ඡාව සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස මහේස්ත්‍රාත්වරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග කළේය. නතාෂාට එරෙහිව ICCPR පනත යටතේ චෝදනා ගොනු කිරීමට විරෝධය පළ කරමින් සිවිල් ක්‍රියාකාරිකයින් පිරිසක් විසින් ඉහත ප්‍රවෘත්ති සාකච්ඡාව පවත්වන ලදි. තරිඳු ජයවර්ධන, විදර්ශන කන්නංගර, තරිඳු උඩුවරගෙදර, ලක්මාලි

හේමචන්ද්‍ර සහ බ්‍රිටෝ ප්‍රනාන්දු එහිදී අදහස් පළ කළහ.

මූලාශ්‍රය: www.bbc.com, facebook.com

02. **ගෝල්ෆේස් අරගලකරුවන්ට පහරදීම සම්බන්ධ නඩුව, කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ කැඳවීම.**

මෙම නඩුව ජුනි 07 වැනිදා කැඳවූ අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට වාර්තා කළේ, මෙම නඩුවේ සැකකරුවන් සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් ලැබී ඇති නමුත් එම උපදෙස් අභියෝගයට ලක් කරමින් අභියාචනාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් වී ඇති අතර ජුනි 23 වැනිදා ඊට අදාළ තීන්දුව ලැබීමට නියමිත බවයි. ඒ අනුව නඩුව ජූලි 19 වැනිදා යළි කැඳවීමටත්, මෙම නඩුවේ සැකකරුවන් ලෙස නම් කර නොමැති පා.ම. නාමල් රාජපක්ෂ ඇතුළු කිහිපදෙනෙකුට පනවා තිබූ විදෙස් ගමන් තහනම ඉවත් කිරීමටත් මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. හිටපු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, සනත් නිශාන්ත, මිලාන් ජයතිලක ඇතුළු පිරිසක් මෙහි සැකකරුවන් ලෙස නම් කර සිටිති.

මූලාශ්‍රය: www.ft.lk

03. **යෝජිත 'විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභා පනතෙහි' දළ කෙටුම්පතක් විද්‍යුත් විකාශකයින්ගේ සංගමයේ ප්‍රතිචාර සඳහා යොමු කිරීම.**

විද්‍යුත් විකාශන නියාමනය සඳහා නීති සම්පාදනය කළ යුතු බවට 2022 සැප්තැම්බර් 9 දින කැබිනට් මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවකට අනුව, අධිකරණ අමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් පත් කෙරුණු කැබිනට් අනුකමිටුව විසින් මෙම දළ කෙටුම්පත සම්පාදනය කර තිබේ. එය ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් විද්‍යුත් විකාශකයින්ගේ සංගමය වෙත යොමු කර ඇති අතර එහි අන්තර්ගතය පිළිබඳව ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ පාර්ශ්වවල විවේචන පළ වෙමින් තිබේ. එම කෙටුම්පත පිළිබඳ 'නිරීක්ෂණ, විවේචන හා සංශෝධන සඳහා යෝජනා' ඇතුළත් ලේඛනයක් මාධ්‍ය නීති සංසදය විසින් එළිදැක්විණි.

මූලාශ්‍රය: medialawforum.org

04. **යෝජිත විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභා පනත මගින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය උල්ලංඝනය නොකරන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කිරීම.**

මෙම පනතෙහි අරමුණ, විද්‍යුත් මාධ්‍යයක් මගින් කිසියම් පාර්ශ්වයකට අගතියක් සිදුවුහොත්, එම පාර්ශ්වයට සහනයක් ලබාගැනීම සඳහා අවස්ථාව සැලසීම පමණක් බවද එහිදී එක්සත් රාජධානියේ විද්‍යුත් මාධ්‍ය සඳහා තිබෙන මාර්ගෝපදේශන එලෙසින්ම ඇතුළත් කිරීමට තමා උපදෙස් දී ඇති බවද ජනාධිපතිවරයා පැවසුවේය. ඒ, ජුනි 15 වැනිදා හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති උත්සවයක් අමතමිනි. අදාළ පනත පිළිබඳ දළ කෙටුම්පතක් රජය විසින් ඉදිරිපත් කර ඇති අතර, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් ජනමාධ්‍ය ඇමතිවරයා විසින්ද ජුනි 13 වැනිදා මාධ්‍ය හමුවේ සිදු කරන ලදි.

මූලාශ්‍රය: lankafocusnews.com, sinhala.news.lk

05. **අරගලයේ ක්‍රියාකාරිකයින් පිරිසකට එරෙහි නඩුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ කැඳවීම.**

කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ප්‍රධාන දොරටුව අවහිර කරමින් 2022 මැයි 30 වැනිදා විරෝධතාවක නිරත වූ බවට චෝදනා කරමින් රංගන ශිල්පිනී දමිතා අබේරත්න, ජෝසප් ස්ටාලින්, රතිඳු සේනාරත්න ඇතුළු අරගලයේ ක්‍රියාකාරීන් 9 දෙනෙකුට එරෙහිව කොම්පඤ්ඤවීදිය පොලිසිය මෙම නඩුව ගොනු කර ඇත. ජුනි 20 වැනිදා නඩුව කැඳවූ අවස්ථාවේදී, අදාළ චෝදනා සම්බන්ධයෙන් විමර්ශන වාර්තාවක් මීළඟ නඩු දිනයේදී ඉදිරිපත් කරන ලෙස පොලිසියට නියෝග කළ මහේස්ත්‍රාත්වරයා, නඩුව ඔක්තෝබර් 09 වැනිදා යළි කැඳවන ලෙස නියම කළේය.

මූලාශ්‍රය: www.dailymirror.lk

06. **උද්ඝෝෂණයකදී රජයේ දේපළවලට අනර්ථයක් සිදු කළ බවට චෝදනා ලැබ සිටි හිටපු විශ්වවිද්‍යාල සිසුන් 22 දෙනෙකු අධිකරණයෙන් නිදොස් කොට නිදහස් කිරීම.**

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ හිටපු කැඳවුම්කරු උදුල් ප්‍රේමරත්න ඇතුළු හිටපු විශ්වවිද්‍යාල සිසුන් 22 දෙනෙකුට එරෙහිව නීතිපතිවරයා මෙම චෝදනා ඉදිරිපත් කොට තිබුණේ, වසර 13කට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරිපිට පැවැත්වූ උද්ඝෝෂණයක් සම්බන්ධයෙනි.

දීර්ඝ නඩු විභාගයකින් පසුව ජුනි 23 වැනිදා සිය තීන්දුව දෙමින් කොළඹ මහාධිකරණ විනිසුරු දමිත් තොටවත්ත පැවසුවේ විත්තිකරුවන්ට එරෙහිව පොදු දේපළ පනත යටතේ නගා තිබූ චෝදනා කිසිවක් සාධාරණ සැකයකින් තොරව ඔප්පු කිරීමට අසමත් වී ඇති බවයි. ඒ අනුව විත්තිකරුවන් සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කෙරිණි.

මූලාශ්‍රය: theleader.lk

07. **ගෝඨාගෝගම විරෝධතාවට පහරදීමේ සිද්ධියේ සැකකරුවකු ලෙස නි. පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් නම් කරන ලෙස නීතිපතිවරයා නිකුත් කර තිබූ ලිපියක්, අභියාචනාධිකරණය නිශ්ප්‍රභ කිරීම.**

නි. පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් අභියාචනාධිකරණය හමුවේ ගොනු කර තිබූ රිට් පෙත්සම් දෙකක් පිළිබඳ තීන්දුව ප්‍රකාශයට පත් කරමින් අභියාචනාධිකරණය විසින් ජුනි 26 වැනිදා එම නියෝගය නිකුත් කෙරිණි. 2022 මැයි 09 වැනිදා සිදු කෙරුණු එම ප්‍රහාරය වැළැක්වීමට ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා

වගකිවයුතු බවට පාර්ශ්ව රැසක් විසින් කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නීතිපතිවරයා විසින් අදාළ ලිපිය නිකුත් කර තිබිණි.

මූලාශ්‍රය: www.newsfirst.lk

08. **අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනයක් හේතුවෙන් තමන්ට සිදු වන අගතිය සම්බන්ධයෙන් මාධ්‍යවේදී දර්ශන හඳුන්ගොඩ අධිකරණයට කරුණු ඉදිරිපත් කිරීම.**

කොළඹ දිසා අධිකරණයෙහි සිවිල් නඩුවක් පවරා ඇති කරුණකට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙනම පරීක්ෂණයක් ආරම්භ කිරීම, එම දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රකාශ ලබාගැනීම, නිවස පරීක්ෂාවට ලක් කිරීම හා පරිගණකය ඇතුළු සිය වෘත්තීය මෙවලම් ලබා දෙන ලෙස බල කිරීම සම්බන්ධයෙන් මෙහිදී කරුණු දක්වා තිබේ.

එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුරට අදාළ වන්දි ලබාගැනීම පිළිබඳව යූටියුබ් නාලිකාවක පළ කළ වීඩියෝවක් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්ත අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු හා රජයේ නීතිඥවරයකු විසින් කොළඹ දිසා අධිකරණය හමුවේ පවරා ඇති නඩුවට, ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න මගින් ජුනි 7 වැනිදා මෝසමක් ඉදිරිපත් කරමින් ඔහු මෙම කරුණු ඉදිරිපත් කර තිබේ.

මූලාශ්‍රය: youtube.com

09. **නතාෂා එදිරිසූරිය තවදුරටත් බන්ධනාගාරගත කිරීම හා බෲනෝ දිවාකර ඇප මත මුදාහැරීමට අධිකරණය නියෝග කිරීම.**

බුදුදහමට අපහාස කිරීමේ චෝදනාව මත රක්ෂිත බන්ධනාගාරගත කර සිටි ප්‍රහසන කලා ශිල්පිනී නතාශා එදිරිසූරිය තවදුරටත් බන්ධනාගාරගත කිරීමටත්, ඇයට ආධාර අනුබල දීමේ චෝදනාව මත රක්ෂිත බන්ධනාගාරගත කර සිටි SL Vlog යූටියුබ් නාලිකාවේ හිමිකරු බෲනෝ දිවාකර ඇප මත මුදාහැරීමටත් කොළඹ කොටුව මහේස්ත්‍රාත්වරයා ජුනි 21 වැනිදා නියෝග කළේය.

ඒ අනුව බෲනෝ දිවාකරට රුපියල් 50,000ක මුදල් ඇප සහ රුපියල් මිලියන 02ක ශරීර ඇපයක් නියම කළ අතර ඔහුගේ විදෙස් ගමන් තහනම් කිරීමටද නියෝග කෙරිණි.

මූලාශ්‍රය: bbc.com

10. **ආගමික සංහිඳියාවට හානි වන ආකාරයේ ප්‍රකාශ සිදු කිරීමේ චෝදනාව මත අත්අඩංගුවට ගත් රාජාංගනේ සද්ධාරතන හිමි යළි රක්ෂිත බන්ධනාගාරගත කිරීම.**

සද්ධාරතන හිමි මැයි 28 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ජුනි 07 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර තිබිණ. එදින නඩුව යළි කැඳවූ අවස්ථාවේ, ජුනි 21 වැනිදා දක්වාද, ඉන් පසුව ජූලි 5 වැනිදා දක්වාද තවදුරටත් බන්ධනාගාරයේ තැබීමට නියෝග කෙරිණි. ICCPR පනත, පරිගණක අපරාධ පනත හා දණ්ඩ නීති සංග්‍රහයේ 120 වගන්තිය යටතේ හිමිනමට එරෙහිව චෝදනා ගොනු කොට තිබේ.

මූලාශ්‍රය: adaderana.lk

11. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරික ප්‍රියත් නිකේෂල, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අත්අඩංගුවට ගැනීම.**

ඉකුත් වසරේ ජූලි මස 9 වැනි දින, එවකට අග්‍රාමාත්‍යවරයාව සිටි රනිල් වික්‍රමසිංහ මහතාගේ කොල්ලුපිටියෙහි පිහිටි පෞද්ගලික නිවෙස ගිනි තැබීමේ සිද්ධිය සමාජ මාධ්‍ය ජාල ඔස්සේ ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා ජුනි 26 වැනිදා ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබූ අතර එහිදී අත්අඩංගුවට ගෙන ඇත. පසුදා (27) කොටුව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු. 25,000ක මුදල් හා රු. ලක්ෂ 5ක් වටිනා ශරීර ඇප 2ක් මත මුදාහැරිණි.

මූලාශ්‍රය: mawbima.lk

12. **ප්‍රවෘත්ති සාකච්ඡාවක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට ලබා දුන් නියෝගය බල රහිත කරන්නැයි ප්‍රතිශෝධන පෙත්සමක් ඉදිරිපත් කිරීම.**

ප්‍රහසන ශිල්පිනී නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගැනීම පිළිබඳව පැවැත්වූ ප්‍රවෘත්ති සාකච්ඡාවකින් අධිකරණයට අපහාසයක් සිදුවී දැයි සොයා බලන ලෙස කොටුව මහේස්ත්‍රාත් අධිකරණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන් නියෝගය බල රහිත කරන ලෙස ඉල්ලා, කොළඹ මහාධිකරණය හමුවේ මෙම ප්‍රතිශෝධන පෙත්සම ගොනු කර ඇත. මැයි 29 වැනිදා පැවති එම ප්‍රවෘත්ති සාකච්ඡාවේදී අදහස් පළ කළ මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන විසින් මෙම පෙත්සම ගොනු කරන ලදි.

මූලාශ්‍රය: www.bbc.com

13. **අධිකරණයට අපහාස කිරීම පිළිබඳ නීති කෙටුම්පතක් රජය විසින් ප්‍රකාශයට පත් කිරීම.**

"අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම පිළිබඳ පනත" නමින් වන එම පනත් කෙටුම්පත ජුනි 27 දාතමින් ගැසට් පත්‍රයෙහි පළ කර තිබේ. මෙතෙක් පැහැදිලි නිර්වචනයක් නොතිබුණු 'අධිකරණ අපහාසය' යන්න මෙම පනත් කෙටුම්පත මගින් අර්ථ දක්වා ඇති නමුත් භාෂණයේ ප්‍රකාශනයේ හා ජනමාධ්‍යකරණයේ නිදහසට එමගින් දැඩි බලපෑමක් එල්ල වන බවට ප්‍රතිචාර පළ වෙමින් තිබේ.

මූලාශ්‍රය: sinhala.srilankabrief.org

## වෘත්තියවේදීත්වය

**වෘත්තියවේදීත්වය යන සංරචකය යටතට, මාධ්‍යවේදීන්ට හොඳ අධ්‍යාපනයක් තිබීම, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධීනත්වය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිගැනීම යන දර්ශක ඇතුළත් වේ. මෙම සංරචකය යටතට ගැනෙන එක් සිදුවීමක් ජුනි මාසයේදී නිරීක්ෂණය විය.**

**4 වගුව: 2023 ජුනි: වෘත්තියවේදීත්වය - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය | 01 |
| **එකතුව** | **01** |

01. **රූපවාහිනී නාලිකා දෙකකට හා වෙබ් අඩවි දෙකකට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම.**

හිරු, දෙරණ යන රූපවාහිනී නාලිකා සහ දසත ලංකා, මාධ්‍යවේදියා යන වෙබ් අඩවි මගින් දිගින් දිගටම ආගම්වාදය වපුරන අන්දමින් පුවත් පළ කරන බවට මෙම පැමිණිල්ල මගින් කරුණු දක්වා තිබේ. නතාෂා එදිරිසූරියගේ ආන්දෝලනාත්මක ප්‍රහසනය සම්බන්ධයෙන් සිදු කළ වාර්තාකරණය සම්බන්ධයෙන් මෙහිදී විශේෂයෙන් අවධාරණය කර ඇති අතර, 'රැඩිකල් මැද සාමූහිකය' වෙනුවෙන් චින්තන ධර්මදාස, මහාචාර්ය රොහාන් සමරජීව හා ජයනි අබේසේකර විසින් ජුනි 13 වැනිදා මෙම පැමිණිල්ල ඉදිරිපත් කරන ලදි.

මූලාශ්‍රය: theleader.lk

---

## ව්‍යුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම සංරචකයට ඇතුළත්ය. මේ අතුරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන සිදුවීම් 02ක් මෙහි ඇතුළත් වේ.**

**5 වගුව: 2023 ජුනි: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 02**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 02 |
| **එකතුව** | **02** |

01. **ප්‍රහසන ශිල්පිනී නතාෂා අත්අඩංගුවට ගැනීම සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ යෝජිත පනත, ජිනීවා මානව හිමිකම් සැසිවාරයේදී විවේචනයට ලක් වීම.**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ නියෝජ්‍ය මහ කොමසාරිස්වරිය Nada Al-Nashif විසින්, මානව හිමිකම් කොමිසමේ 53වන සැසිවාරය සඳහා ජුනි 22 වැනිදා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලදි. නතාෂා හා පා.ම. ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් අත්අඩංගුවට ගැනීම, විරෝධතා හා විරෝධතා පළ කරන නායකයින් සම්බන්ධයෙන් දැඩි මර්දන පිළිවෙතක් අනුගමනය කිරීම, පොලිස් රාජකාරි සඳහා හමුදාව යොදාගැනීම, මාර්තු මාසයේදී ගැසට් කරන ලද නව "ත්‍රස්තවාදයට එරෙහි" පනත් කෙටුම්පතහි අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, සාමකාමීව රැස්වීම් සහ කම්කරු අයිතිවාසිකම් පවා සීමා කරන පුළුල් විධිවිධාන අඩංගු වීම යනාදී කරුණු එමගින් අවධානයට ලක් කර ඇත.

මූලාශ්‍රය: www.tamilguardian.com

02. **මාධ්‍ය නියාමනය, රාජ්‍ය මර්දනය, කලාවේ හා ප්‍රකාශනයේ නිදහස මැයෙන් සංවාදයක් පැවැත්වීම.**

ප්‍රහසන කලා ශිල්පිනී නතාෂා එදිරිසූරිය නිදහස් කර ගැනීම වෙනුවෙන් කොළඹ ක්‍රියාකාරී කමිටුව විසින් සංවිධානය කරන ලද මෙම සංවාදය, ජුනි 17 වැනිදා Zoom ඔස්සේ පැවැත්විණි. ලේඛක පරාක්‍රම කුරුප්පු, නීතිඥ සංජය විල්සන් ජයසේකර, මාධ්‍යවේදී නන්දන නන්නෙත්ති සහ මාධ්‍යවේදී ශාන්ත විජේසූරිය මෙහිදී අදහස් දැක්වූහ.

මූලාශ්‍රය: facebook.com

**6 වගුව: මාධ්‍ය නිදහස: 2023 ජනවාරි-ජූනි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2023 ජනවාරි - මැයි | | 2023 ජූනි |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 18 | - | 04 |
| නීතිමය කොන්දේසි | 37 | 08 | 13 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | - | - | - |
| වෘත්තීයවේදීත්වය | 03 | - | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 19 | - | 02 |
| **එකතුව** | **77** | **08** | **20** |

පසුගිය මාධ්‍ය නිදහස මාසික වාර්තා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement

Convener: Hana Ibrahim +94 77 741 2995 | Secretary: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620
Treasurer: Thaha Mñammil +94 77 3741026 | Assistant Secretary: Priyadarshani Sivaraja +94 772530258
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25


Layout: Nalinda Seneviratne